# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,276 - 2022 අප්‍රේල් මස 12 වැනි අඟහරුවාදා - 2022.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 716 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 718 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 720 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 මැයි මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අප්‍රේල් මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


715 - B 82333 - 5,403 (2022/04)

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - අක්කරපත්තුව**

අක්කරපත්තුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2022

1. අක්කරපත්තු මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදළ රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද හා අංක සොයාගත නොහැකි වූ පහත සඳහන් නඩු භාණ්ඩ **2022.04.24** වැනි දින පෙ. ව. 9.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

3. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

4. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය.

5. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

6. වෙන්දේසිය සඳහා පැමිණෙන්නන් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් වන සියලුම සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කළ යුතු අතර එකී මාර්ගෝපදේශයන්ට අවනතව කටයුතු කළ යුතු ය.

එම්. එච්. මොහොමඩ් හම්සා,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
අක්කරපත්තුව.

| අනු අංකය | නඩු අංකය | වර්ගය | ගණන |
|---|---|---|---|
| 01. | AR/1234/21 | පාපැදි | 19 |
| 02. | AR/1430/2022 | විදුලි මෝටරයක් | |
| 03. | AR/1429/2022 | යකඩ කැටය | |

| අනු අංකය | නඩු අංකය | වර්ගය | ගණන |
|---|---|---|---|
| 01. | AR/1360/21 | යතුරු පැදිය | |
| 02. | AR/1361/21 | යතුරු පැදිය | |
| 03. | AR/1362/21 | යතුරු පැදිය | |
| 04. | AR/1363/21 | යතුරු පැදිය | |
| 05. | AR/1364/21 | යතුරු පැදිය | |
| 06. | AR/1365/21 | යතුරු පැදිය | |
| 07. | AR/1366/21 | යතුරු පැදිය | |
| 08. | AR/1367/21 | යතුරු පැදිය | |
| 09. | AR/1368/21 | යතුරු පැදිය | |
| 10. | AR/1369/21 | යතුරු පැදිය | |
| 11. | 55092/MT/19 | යතුරු පැදිය (EP GE - 6100) | |
| 12. | 55533/MT/19 | යතුරු පැදිය (EP HO - 7870) | 01 |
| 13. | 54530/MT/19 | යතුරු පැදිය (159 - 1359) | 01 |
| 14. | 55214/MT/19 | යතුරු පැදිය (EP MB - 2409) | 01 |

| අනු අංකය | නඩු අංකය | වර්ගය | ගණන |
|---|---|---|---|
| 01. | 62139/MISC/21 | වැලි | |
| 02. | 62144/MISC/21 | වැලි | |
| 03. | 62145/MISC/21 | වැලි | |
| 04. | 62146/MISC/21 | වැලි | |
| 05. | 62168/MISC/21 | වැලි | |
| 06. | 62166/MISC/21 | වැලි | |
| 07. | 62169/MISC/21 | වැලි | |
| 08. | 62171/MISC/21 | වැලි | |
| 09. | 62217/MISC/21 | වැලි | |
| 10. | 62216/MISC/21 | වැලි | |
| 11. | 62218/MISC/21 | වැලි | |
| 12. | 62243/MISC/21 | වැලි | |
| 13. | 62246/MISC/21 | වැලි | |
| 14. | 62250/MISC/21 | වැලි | |

04-197

**දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය**

දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුවලට අදළව නඩු භාණ්ඩ වශයෙන් ඉදිරිපත් කර තිබූ, මෙතෙක් හිමිකම් පාන්නෙකු ඉදිරිපත් නොවූ වාහන රාජසන්තක කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා පියවර ගැනීමට සිදුවී ඇත.

එබැවින් පහත විස්තර සඳහන් රථවාහන සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු සිටීනම් මෙම නිවේදනයේ දින සිට මාස 02ක් ඇතුළත හිමිකම්පෑමට අදාළ ලේඛන සමග දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් වී දැනුම් දෙන ලෙස මෙයින් දන්වා සිටිමි.

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහන විස්තරය* |
|---|---|---|
| 01. | 30661 | EDGRI SUPER 12 අත් ට්‍රැක්ටරය |
| 02. | 4811 | 101 - 8133 යතුරු පැදිය |
| 03. | B 706/20 | EP BBW 7700 යතුරු පැදිය |

ඩබ්. එම්. අයි. වාසල,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,

දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
දෙහිඅත්තකණ්ඩිය.

04-185

---

**ලංකා බැංකුව**

ලංකා බැංකුව විසින් පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියයි

**කැඩී බිඳීගිය බහුදින ධීවර බෝට්ටුව**

| *යාත්‍රාවේ වර්ගය* | *බහුදින ධීවර බෝට්ටුව* |
|---|---|
| මුල් ලියාපදිංචියේ දිනය | 1999.06.16 |
| බෝට්ටු කඳ නිර්මාණය සඳහා යොද ඇති ද්‍රව්‍ය | ෆයිබර්ග්ලාස් |
| ලියාපදිංචි අංකය | 8-1988 TLE |
| යාත්‍රාව නිර්මාණය කර අවසන් කළ දිනය | 1999.05.03 |
| බෝට්ටුවේ වත්මන් තත්ත්වය | කැඩී බිඳීගිය යාත්‍රාවකි. |

ඉහත සඳහන් පිරිවිතර වලින් සමන්විත බහුදින යාත්‍රාවක් මීගමුව, මුන්නක්කරය මන්කුලිය පාරේ 7 A දරන බෝට්ටු අංගනයේ දී **2022.04.27 වැනි දින පෙ. ව. 10.30** ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා ඇත.

වෙන්දේසියේදී ලංසුව භාරගත් විට විකිණීමට අදළ මුළු මුදල මුදලින් ගෙවිය යුතු අතර වෙන්දේසියේ විකිණීම අවසන් වූ පසුව බෝට්ටුව මිලදීගත් අයගේ සන්තකයෙහි තබා ගැනීමට ඉවත් කර ගත හැක.

*විමසීම් .-* මෙහෙයුම් කළමනාකරු, ලංකා බැංකුව, බස්නාහිර පළාත උතුර, දෙවන මහල, ලංකා බැංකු මර්චන්ට් ටවර් ගොඩනැගිල්ල, කොළඹ 03.

දුරකථන අංක : 011 2422146.

04-190

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

වෙන්නප්පුව, නැගෙනහිර දුම්මලදෙනිය, අංක 83 හි පදිංචිව සිට දැනට නවසීලන්තය, ඕක්ලන්ඩ්, බේ විව්, ග්ලෙන්ෆීල්ඩ් පාර, අංක 606 හි පදිංචි වර්ණකුලසූරිය ලෙස්ලි නෙල්සන් කෲස් යන අයට බලය පවරන ලද වර්ෂ 2018.01.16 වැනි දින ඩෙන්සිල් ෆොන්සේකා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කළ අංක 40231 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර, ප්‍රත්‍යාදිෂ්ඨ කර මින්මතු එකී ඇටර්නි බලකරු විසින් කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වගනොකියන බව ද ශ්‍රී ලංකා ජනරජය වෙත මෙයින් දැනුම් දෙමි.

වර්ණකුලසූරිය නෙල්සන් කෲස්.

04-182

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මුල්ලේරියාව නව නගරය හිඹුටාන අභිනවාරාම පාරෙහි අංක 303/4 A හි පදිංචි (ජා. හැ. අ. 197728400136) හා පාස්පෝට් බලපත්‍ර අංක PB LKAN 8622672 දරන දිනේෂ් කුමාර සේනානායක වන මා විසින් 2021.07.28 ඕක්ලන්ඩ් නවසීලන්තයේ හි දී අත්සන් කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රයෙහි ඇටර්නි බලකරු ලෙස නම් කළ මාලඹේ, කහන්තොට පාරෙහි අංක 94/7/23 හි පදිංචි (ජා. හැ. අ. 805641118 V) දරන ජයසුන්දර මුදියන්සේලාගේ දිල්හාන් සේනානි සම්පත් බණ්ඩාර මහත්මියට දී ඇති ඇටර්නි බලය මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලංකාවාසී සියලු ජනතාවගේ දැන ගැනීම පිණිස මෙයින් ප්‍රකාශ කරමි.

දිනේෂ් කුමාර සේනානායක.

04-189

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

අංක 34/21A, 5 වන පටුමග, ධර්මරත්න මාවත, රාවතාවත්ත, මොරටුව ලිපිනයෙහි (දැනට 2015=40, ෆවුන්ටන්හෙඩ් රෝඩ්, ටොරොන්ටෝ, M3J2vl කැනඩාව) පදිංචි මාවලගේ හසන්ත දිල්රුක්ෂ (ජා. හැ. අංක 197110800805) වන මා විසින් අංක 34/21, 5 වන පටුමග, ධර්මරත්න මාවත, රාවතාවත්ත, මොරටුව හි පදිංචි එස්මි අගම්පොඩි (ජා. හැ. අංක 195461701655) වෙත බලය පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කේ. පී. ජීවනී සඳලංකා සහතික කළ අංක 295 හා 2021.03.10 දිනැති ඇටර්නි බලපත්‍රය මෙදින සිට අවලංගු කරන බව ශ්‍රී ලංකා ආණ්ඩුව හා මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

මාවලගේ හසන්ත දිල්රුක්ෂ.

04-199

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : වට්ටක්ගොඩ ස්පයිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 126705
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 111, දෙණියාය පාර, අකුරැස්ස
ලියාපදිංචි දිනය : 2017.10.26

(ඉහත සඳහන් සමාගමේ ලේකම්)

04-200

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ෆියුචර් ටෙක් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 96807
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : 21/15, පොල්හේන්ගොඩ උද්‍යානය, කොළඹ 05
ලියාපදිංචි දිනය : 2014.01.30

(ඉහත සඳහන් සමාගමේ ලේකම්)

04-201

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

වැලිගම, බටවල ටැල්බොට් එස්ටේට් හි පදිංචි සුසීමා ලීලානි ජාලත්ගේ විවාහයට පෙර ගලප්පත්ති (ජා. හැ. අ. 526624033 V) මහත්මියට ප්‍රසිද්ධ නොතාරිස් නිමල් දයාරත්න කුරුවිට බණ්ඩාර විසින් 1991.08.25 වැනි දින පවරනු ලැබූ අංක 329 දරන ඇටර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර, නිෂ්ප්‍රභාකර, බලරහිත කර ඇති බව රාජගිරිය, කලපළුවාව, 01 වන පටුමග, අංක 227 හි පදිංචි වෛද්‍ය ලීලාමනී රේණුකා ෆොන්සේකා හෙවත් ලීලාමනී රේණුකා ගලප්පත්ති වන මා මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

ඉහත කී ඇටර්නි බලපත්‍රය මත ඉහත කී සුසීමා ලීලානි ජාලත්ගේ විවාහයට පෙර ගලප්පත්ති මහත්මිය විසින් අද සිට මින් මතුවට කරනු ලබන යම් ක්‍රියාවකට හෝ අත්සන් කරනු ලබන යම් ලේඛනයකට මා විසින් වගකියනු නොලබන බවද මෙයින් දැනුම් දෙමි.

(වෛද්‍ය ලීලාමනී රේණුකා ෆොන්සේකා
හෙවත් ලීලාමනී රේණුකා ගලප්පත්ති)

04-207

## ඇටර්නි බලය අවලංගු කිරීම

පිළියන්දල, බෝකුන්දර, සඳකිරණ මාවත, අංක 99/1 දරන ස්ථානයේ පදිංචි ජයකොඩිගේ දෝන දිල්රුක්ෂි කෝකිලානි (ජා. හැ. අංක 748475141 V) වන මම ප්‍රසිද්ධ නොතාරිස් චාන්දනී සෙනෙවිරත්න මහත්මිය විසින් ලියා සහතික කළ අංක 227 සහ වර්ෂ 2013.11.01 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් පිළියන්දල, බෝකුන්දර, සඳකිරණ මාවත, අංක 99/1 දරන ස්ථානයේ පදිංචි අඹගහ හේවගේ දොන් භාරත රංග (ජා. හැ. අංක 770170397 V) වෙත පවරන ලද බලය වර්ෂ 2022 ක්වූ මාර්තු මස 24 වැනි දින සිට අවලංගු කරන ලද බවත් එදිනට පසු ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ මහජනතාව වෙත මින් දන්වා සිටිමි.

ජයකොඩිගේ දෝන දිල්රුක්ෂි කෝකිලානි.

04-210

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 82/1, ගාලු පාර, දෙහිවල - උතුර සහ දැනට VIA DELL, OLMO 10, SAN CASCIANO IN VAL DI PESA FIRENZE, ITALY හි පදිංචි හිරන්ති මනෝරි ජයසිංහ විසින් 2015.11.30 දින ලියා සහතික කරන ලද බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ 2016.01.26 දිනැතිව ලියාපදිංචි කරන ලද දිනපොත් අංක 157, 63 වෙළුමේ 985 දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇති විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් අංක 82/1, ගාලු පාර, දෙහිවල උතුර හි පදිංචි පර්සි වර්ණකුලසූරිය වන මා හට දෙනු ලැබූ ඇටර්නි බලපත්‍රය 2022.04.06 වැනි දින සිට අවලංගු කළ බව මෙයින් දන්වා සිටිමි.

පර්සි වර්ණකුලසූරිය.

04-214

---

## අංක 11461 විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගුකර ශූන්‍ය ලියවිල්ලක් ලෙස පත් කිරීම

මා විසින් මතුගම, අළුත්ගම පාරේ, අංක 137/1 හි පදිංචි මද්දුමාගේ ධනපාල මයා (ජාතික හැඳුනුම්පත් අංක 550760436 V) වෙත ලබාදෙන ලද වර්ෂ 2014 ක් වූ ජනවාරි මස අට වන දින දාතමින් යුත් හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වාද්දුව ප්‍රසිද්ධ නොතාරිස් රංජිත් රොද්‍රිගු මහතා විසින් ලියන ලද හා ඉහත දින ඔහු ඉදිරියේ මා විසින් අත්සන් කරන්න යෙදුන හා පානදුර පිංවල හි පදිංචි සමරකෝන්ලාගේ දොන් පද්මසිරි සහ වාද්දුව, මාවල අංක 106 දරන ස්ථානයේ පදිංචි ඇතුල්දූර ආරච්චිගේ ජයසේන යන අය සාක්ෂිකරුවන් විසින් අත්සන් කරන්නට යෙදුන අංක 11461 දරන විශේෂ ඇටර්නි බලය 2022 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින සිට බල රහිත හා ශූන්‍ය ලියවිල්ලක් බවට පත්කර අවලංගු කරන බව මෙයින් සියලු දෙනා වෙත ප්‍රසිද්ධියේ දන්වා සිටිමි.

ලිහිණියා කුමාරගේ රෝහිණී පද්මලතා,
(විදේශ ගුවන් බලපත් අංක N2249666)

අංක 32/9, ජයන්ති මාවත, නල්ලුරුව, පානදුර.

04-216

## අංක 1940 විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගුකර ශූන්‍ය ලියවිල්ලක් ලෙස පත් කිරීම

මා විසින් පානදුර, නල්ලුරුව ජයන්ති මාවත, අංක 32/9 හි පදිංචි මද්දුමාගේ ධනපාල මයා (ජාතික හැඳුනුම්පත් අංක 550760436 V) වෙත ලබාදෙන ලද වර්ෂ 2013 ක් වූ අගෝස්තු මස විසි හය වන දින දාතමින් යුත් හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මනෝහාරි ද සිල්වා මහත්මිය විසින් ලියන ලද හා ඉහත දින ඔහු ඉදිරියේ මා විසින් අත්සන් කරන්න යෙදුන හා හොරණ කනන්විල, පෙරෙන්හියාවෙල හන්දියේ පදිංචි මද්දුමාගේ සුනිල් ශාන්ත (ජා. හැ. අංක 581220235 V) සහ පානදුර බටහිර මලමුල්ල පොකුණ පාරේ අංක 261/ඒ, දරන ස්ථානයේ පදිංචි කඳනආරච්චිගේ දයානන්ද රෝහිත පෙරේරා (ජා. හැ. අංක 450571929 V) යන අය සාක්ෂිකරුවන් විසින් අත්සන් කරන්නට යෙදුන අංක 1940 දරන විශේෂ ඇටර්නි බලය 2022 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින සිට බල රහිත හා ශූන්‍ය ලියවිල්ලක් බවට පත්කර අවලංගු කළ බව මෙයින් සියලු දෙනා වෙත ප්‍රසිද්ධියේ දන්වා සිටිමි.

ලිහිණියා කුමාරගේ රෝහිණී පද්මලතා,
(විදේශ ගුවන් බලපත් අංක N 2249666)

අංක 32/9, ජයන්ති මාවත, නල්ලුරුව, පානදුර.

04-217

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස මෙසේ දැනුම් දෙනු ලැබේ.

තෝලංගමුව, දෙල්ගමුව, අංක බී/100/1 යන ලිපිනයේ පදිංචි පුලිහිංගලාගේ ප්‍රියන්ති රාජපක්ෂ වන මා විසින් මාගේ ඇටර්නි බලකරු වශයෙන් අගුණකොල පැලැස්ස, කාරියමඩිත්ත, බූවැලිආර, රාජාසෙවන අංක 162 යන ලිපිනයේ පදිංචි කෝට්ටේ ආරච්චිගේ සිරෝමි දිල්රුක්ෂි යන අය වෙත රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ 03 කාණ්ඩයේ 26 පත්ඉරුවේ 883 දිනපොත් අංකය යටතේ ලියාපදිංචි කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් බුද්ධදේව ගුණරත්න මහතා විසින් 2021 මාර්තු මස 13 දින ලියා සහතික කරන ලද අංක 2070 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ශූන්‍ය කර බලරහිත කර සිටිමි. මෙතැන් සිට එකී කෝට්ටේ ආරච්චිගේ සිරෝමි දිල්රුක්ෂි යන අය මා වෙනුවෙන් කරන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ ඇතුළත් වනු ලබන කිසිම ගිවිසුමක් සම්බන්ධයෙන් මා වගකියනු නොලබන බව ද මෙයින් දැනුම් දෙමි.

පුලිහිංගලාගේ ප්‍රියන්ති රාජපක්ෂ.

04-349

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස මෙසේ දැනුම් දෙනු ලැබේ.

රත්නපුර, කොස්පැලවින්න, අංක 35/12 සී යන ලිපිනයේ පදිංචි කළුආරච්චිගේ එරික් උදේන්ද්‍ර වන මා විසින් මාගේ ඇටර්නි බලකරු වශයෙන් බදුල්ල, නිකවත්ත පාර, අංක 278 යන ලිපිනයේ පදිංචි හතුරුසිංහ මුදියන්සෙලාගේ අනුර බණ්ඩාර යන අය වෙත රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලිඛිත බලධාරිකම් හා ඇටර්නි බලපත්‍ර පොතේ 23 කාණ්ඩයේ 268 පත්ඉරුවේ 1968 දිනපොත් අංකය යටතේ ලියාපදිංචි කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් හේමින්ද්‍ර දයාවංශ මහතා විසින් 2018 නොවැම්බර් මස 27 දින ලියා සහතික කරන ලද අංක 1154 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ශුන්‍ය කර බලරහිත කර සිටිමි. මෙතැන් සිට එකී හතුරුසිංහ මුදියන්සෙලාගේ අනුර බණ්ඩාර යන අය මා වෙනුවෙන් කරන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ ඇතුළත් වනු ලබන කිසිම ගිවිසුමක් සම්බන්ධයෙන් මා වගකියනු නොලබන බව ද මෙයින් දැනුම් දෙමි.

කළු ආරච්චිගේ එරික් උදේන්ද්‍ර.

04-350

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## මහජන බැංකුව - හසලක ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මිනිපේ කන්දපහළ කෝරළේ, මොරයාය ග්‍රාම නිලධාරි වසමේ, බෝගහයාය නමැති ගමේ පිහිටි කේ. එම්. එස්. බණ්ඩාර අවසරලත් මිනින්දෝරු තැන විසින් 2007.08.09 දින මැන සාදන ලද අංක 114 බී දරන පිඹුර ප්‍රකාරව ඇති ඉඩම ඇතුළු ඊට අයත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : රූඩ් 01, පර්. 10

(මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/N/11/283/2011 පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත)

සහ

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල පල්ලෙසියපත්තුව කෝරළේ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ එම ප්‍රාදේශීය සභා සීමාව තුළ රත්තොටයාය ග්‍රාම නිලධාරි වසමේ, රත්තොට ගමේ පිහිටි, ඩබ්. ඒ. පියදාස අවසරලත් මිනින්දෝරු තැන විසින් 2007.05.13 දින මැන සාදන ලද අංක 47/03/2007 දරන පිඹුර ප්‍රකාරව ඇති ඉඩම ඇතුළු ඊට අයත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : අක්. 01, රූඩ් 01, පර්. 13.3

(මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/K/05/79, LDO/N3/65/2014 පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ **2022 මැයි මස 06 වැනි සිකුරාදා පෙ. ව. 10.30** සිට හසලක මහජන බැංකු පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID - 19 ක්‍රියා පිළිවෙතට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*තීරණය පිළිබඳ නිවේදනය.* - කරුණාකර 2021.10.22 දින රජයේ *ගැසට් පත්‍රය* ද, දිනමිණ, ඩේලිනිව්ස් සහ තිනකරන් පුවත්පත් දැන්වීම් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල මුදලින් ම ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක් (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2%ක් (සියයට දෙකහමාර) සහ එම කොමිස් මුදලට අදාළ සියලුම බදු,
4. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500ක්,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැනුම් මිලෙන් 90% (සියයට අනුවක්) වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කළමනාකරු, මහජන බැංකුව, හසලක ශාඛාව වෙත ගෙවිය යුතු වේ.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් අදාළ තොරතුරු කළමනාකරු, මහජන බැංකුව, හසලක ශාඛාව වෙතින් ලබාගත හැක. දුරකතන අංකය : 055 - 2258000.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය''

ප්‍රේමසිරි වඩුගේ,
සාම විනිසුරු (මුළු දිවයිනටම) විශ්‍රාමික
මහාධිකරණ රෙජිස්ට්‍රාර්,
බලයලත් වෙන්දේසිකරු, උසාවි කොමසාරිස්.

''උත්පලා'' සඳගිරිවත්ත,
ගම්පහ
දුරකතන අංක : 0777003939, 0716172804, 0711659616.

04-414

---

**ඩීඑෆ්සීසී බැන්ක් පී. එල්. සී.**

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙතට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඩී එෆ් සී සී බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තෑව විසින් 2015 ජූලි මස 06 වැනි දින ලියා සහතික කරන ලද අංක 9065, 2016 ජූලි මස 26 වැනි දින ලියා සහතික කරන ලද අංක 9720, 2018 ජුනි මස 01 වැනි දින ලියා සහතික කරන ලද අංක 11330 දරන ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමින් වූ උකස් බැඳුම්කරයන් මගින් මොහමඩ් නසීර් අහමඩ් රොෂාන් යන අය ණය ගැණුම්කරු වශයෙන් ඩීඑෆ්සීසී බැන්ක් පී එල් සී වෙත ගෙවිය යුතුව හා අයවිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති බැවින් එකී බැඳුම්කරයන් මගින් පහත විස්තර කර ඇති දේපළ එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*1 වන විකිණීම.* - **2022 ක් වූ මැයි මස 04 වැනි දින පෙ. ව. 10.30 ට**

උකස් බැඳුම්කර 9065 සහ 9720 මගින් උකස් කර ඇති දේපල. -

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්තපත්තුව මදුරේ කෝරළේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අංක 594 හදිරාමුල්ල ග්‍රාමසේවා නිලධාරි වසම හදිරාමුල්ල ගමේ පිහිටි හදිරාමුල්ලේහේන සහ ලිඳගාවකොටුව දරන ඉඩමට බලයලත් මානක ඒ. ඩී. රංජිත් ප්‍රේමලාල් විසින් 2012.03.17 වැනි දින සාදන ලද අංක 125/2012 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 (එස්. 7363 හි අවසන් ගම් සිතියම් අංක 2636 හි ලොට් අංක 125 හි කොටසක්) නැමති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් එනම් ඊසාන දිගින් : මුතුකෙළියාව කුඹුරෙන් සහ ඇලෙන් ද, දකුණට : නවාස් ෆරීඩ් සහ රසානා යන අයගේ ඉඩමෙන් ද නිරිත දිගින් : පනාගමුව සිට ඊරියගොල්ල පාරෙන් ද සහ වයඹ දිගින් මුතුකෙළියාව කුඹුරෙන් සහ පිඹුරු අංක 2666 හි නිරූපිත ලොට් 05න් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුලු අනෙකුත් සියලු දේ ඉඩම් ප්‍රමාණය රූඩ් 03.

*දේපළට පිවිසීම.*- කුරුණෑගල නගරයේ සිට රම්බොඩගල්ල මාර්ගයේ (කැප්පෙටිගල පාර) කි. මී. 27ක් පමණ පනාගමුව විදුහල් පරිශ්‍රය දක්වා ගමන් ගෙන වමට හැරී ඊරියගොල්ල පාරට පිවිස එම පාරේ මීටර් 250ක් පමණ ගමන් ගත් පසු අදාල දේපල මෙම පාරේ වම් පසින් පිහිටා ඇත.

*2 වන විකිණීම.*- **2022 ක් වූ මැයි මස 04 වැනි දින ප. ව. 2.00 ට**

උකස් බැඳුම්කර 11330 මගින් උකස් කර ඇති දේපල.-

උතුරු මැද පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්තපත්තුව ඉහල විසිදෙකේ කෝරළේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ ගල්කැටිගම ග්‍රාමසේවා නිලධාරි වසම පබුළුව ගමේ පිහිටි බතලවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඕ. ජී. නිමල්සිරි විසින් සාදන ලද 2010.01.22 වැනි දින අංක 17/2010 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 03 නැමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : ඉහත කී පිඹුරේ නිරූපිත ලොට් අංක 02න් ද, නැගෙනහිරටඃ ඇල වේල්ලෙන් ද, දකුණට : ඉහත කී පිඹුරු අංක 17/2010 හි නිරූපිත ලොට් 04න් ද, සහ බටහිරට : පාරෙන් ද, (මීටර් 1.5ක් පළල) යන මෙකී මායිම් තුළ හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් 25.

*දේපළට පිවිසීම.* - කුරුණෑගල නගර මධ්‍යයේ සිට දඹුල්ල පාරේ කි. මී. 11ක් පමණ පන්නල හන්දිය දක්වා ගමන් ගෙන දකුණට පිහිටි බතලගොඩ වැව පාරට පිවිස එම පාරේ මීටර් 500ක් පමණ ගමන් කර දකුණට පිහිටි කොන්ක්‍රීට් පාරට හැරී එම පාරේ මීටර් 250ක් පමණ ගමන් ගෙන නැවත දකුණට හැරී එම පාරේ මීටර් 50ක් පමණ ගමන් කර වම් දෙසට හැරී එම පාරේ මීටර් 30ක් පමණ ගිය පසු අදාළ දේපළ මෙම පාරේ වම් පසින් පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2021.06.04 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2021.05.11 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

ගෙවීමේ ක්‍රමය : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු යඃ

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) සහ අදල බදු,
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : පුනරුත්ථාපන සහ ණය අයකිරීම් අංශය, ඩීඑෆ්සීසී බැන්ක් පී. එල්. සී. අංක 73, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

දුරකතන අංක : 011 - 2 371 371.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකතන ජංගම : 071 4 962 449/071 8 446 374.

04-219

---

**ඩීඑෆ්සීසී බැන්ක් පී. එල්. සී.**

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙතට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඩී එෆ් සී සී බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව ගම්පොල පදිංචි දිසානායක මුදියන්සේලාගේ දිගායු මංජුල දිසානායක යන අය ණයකරු වශයෙන් ඩීඑෆ්සීසී බැන්ක් පී එල් සී (ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් අනුප්‍රාප්තික) නමින් ප්‍රසිද්ධ නොතාරිස් එන්. පිලපිටිය විසින් 2015.07.27 වැනි දින ලියා සහතික කරන ලද අංක 3258 දරන උකස් බැඳුම්කරයන් මගින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කර ඇති පහත විස්තර වන දේපළ, **2022 ක් වූ මැයි මස 05 වැනි දින පෙ. ව. 10.00 ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උකස් බැඳුම්කර 3258 මගින් උකස් කර ඇති දේපළ .-

01. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වැවල ග්‍රාමසේවා නිලධාරි වසම පූජාපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, වැවල ගමේ පිහිටි "ගිනිගත් ඇල" දරන ඉඩමට බලයලත් මානක ඩී. එම්. ඒ. සී. දිසානායක විසින් සාදන ලද 2014.08.21 දිනැති අංක 2267 දරන පිඹුරේ නිරූපිත ලොට් 01 නැමති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : එන්. ජී. සෝමපාල සහ තවත් අය සහ අමිත ප්‍රසාඩ් විජේරත්න විසින් හිමිකම් කියන ගිනිගත් ඇල එස්ටේට් ද, දකුණු - නැගෙනහිරටඃ රූපාවත්ත සිට රඹුක්වැල්ල දෙසට දිස්වෙන ප්‍රාදේශීය සභා පාරෙන් ද, නිරිතදිගින් : රජයේ කනත්ත වෙන් කරන පැල ඉනි වැටෙන්ද හා බස්නාහිරට : වී. එස්. රත්නපාල සහ කේ. ඒ. සුනිල් හිමිකම් කියන ගිනිගත් ඇල එස්ටේට් එකෙන්ද යන මෙකී මායිම් තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය රූඩ් දෙකයි (අ.0, රූ.2, පර්.0) හෙවත් හෙක්ටයාර 0.2034ක්.

02. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය වැවල ග්‍රාමසේවා නිලධාරි වසම, පූජාපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ, වැවල ගමේ පිහිටි "ගිනිගත් ඇල" දරන ඉඩමට බලයලත් මානක ඩී. එම්. ඒ. සී. දිසානායක විසින් 2014.08.21 වැනි දින සාදන ලද අංක 2268 දරන පිඹුරේ නිරූපිත ලොට් 01 නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් එනම් ඊසාන දිගට : එන්. ජී. සෝමපාල සහ තවත් අය විසින් හිමිකම් කියන ගිනිගත් ඇල එස්ටේට් එකෙන් ද, අග්නිදිගින්ඃ රූපාවත්ත සිට රඹුක්වැල්ල දෙසට දිස්වෙන ප්‍රාදේශීය සභා පාරෙන් ද නිරිත දිගින් : කේ. ඒ. ඇග්නස් විසින් හිමිකම් පාන ගිනිගත් ඇල එස්ටේට් එකෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගොඩනැගිලි ගහ කොළ වගාව ඇතුලු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් තිස් හයයි දශම දෙකයි පහක් (පර්. 36.25) හෙවත් 0.09169 හෙක්ටයාර්.

03. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වේවල ග්‍රාමසේවා නිලධාරි වසම පූජාපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ වේවල ගමේ පිහිටි "ගිනිගත් " දරන ඉඩමට බලයලත් මානක ඩී. එම්. ඒ. සී. දිසානායක විසින් 2014.08.21 වැනි දින සාදන ලද අංක 2269 දරන පිඹුරේ ලොට් 01 නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් එනම් උතුරට : රූපවාවත්ත සිට රඹුක්වැල්ල දෙසට දිස්වෙන ප්‍රාදේශීය සභා පාරෙන් ද නැගෙනහිරට : ඇල වෙන් කරන කුඹුරෙන් ද, සහ ඊ. එම්. පොඩිමැණිකා හිමිකම් පාන ගිනිගත් ඇල එස්ටේට් වෙන් කරන අඩිපාරද, දකුණට : කේ. ජී. වසන්ත කුමාර හිමිකම් පාන ගිනිගත් ඇල එස්ටේට් එකෙන් ද, සහ බස්නාහිරට : රූපාවත්ත

සිට රඹුක්වැල්ල දෙසට දිස්වෙන ප්‍රාදේශීය සභා පාරෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුලු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් අටයි දශම දෙකයි පහක් ( පර්. 8.25) හෙවත් 0.02087 හෙක්ටයාර්.

*දේපළට පිවිසීම.* - මහනුවර නගරයේ සිට මාතලේ පාරේ කි. මී. 7.5ක් පමණ අඹතැන්න කඩමණ්ඩිය දක්වා ගමන් ගෙන වමට හැරී පුජාපිටිය පාරට පිවිස එම පාරේ කි. මී. 7ක් පමණ පුජාපිටිය කඩමණ්ඩිය දක්වා ගමන් ගෙන මෙහි දී බොක්කාවෙල පාරට හැරී මෙම පාරේ කි. මී. 4ක් පමණ වැවල හන්දිය දක්වා පැමිණ දකුණට හැරී රඹුක්වෙල ගම පාරට පිවිස එම පාරේ මීටර් 200ක් පමණ ගමන් ගත් පසු අදාළ දේපළ මෙම පාරේ දෙපසින් (වැවල සුසාන භූමියට යාබදව) පිහිටා තිබේ.

යෝජනා සම්මුති සඳහා 2022.02.18 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2022.01.26 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) සහ අදාළ බදු,
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : පුනරුත්ථාපන සහ ණය අයකිරීම් අංශය, ඩීඑෆ්සීසී බැංක් පී. එල්. සී. අංක 73, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011 - 2 371 371.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර,
දුරකථන - ජංගම : 071 4 962 449/071 8 446 374.

04-220

## හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව සමරතුංග මුදියන්සේලාගේ ප්‍රියන්ත සහ බේබි නෝනා සමරතුංග හෙවත් හාල් ඇල්ලේ ගෙදර බේබි නෝනා යන අය බන්ධනදායින් වශයෙන් හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයන්හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**2022 ක් වූ මැයි මස 09 වැනි දින පෙ. ව. 11.00 ට**

*දේපළ විස්තරය.* - නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කන්තලායි ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කන්තලායි අංක 227 කේ ග්‍රාම නිලධාරි වසම තුළ කන්තලායි ගමේ, ලීලාරත්න මාවත වරිපනම් අංක 50 හි පිහිටි කන්තලායිකාඩු නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. සෙල්ලපිල්ලේ විසින් සාදන ලද අංක 3544 හා 2003.11.02 වැනි දින දරන පිඹුරේ ලොට් 01 වශයෙන් දැක්වෙන බෙද වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ සෑම සියලු දේත් වේ.

ඉඩමේ ප්‍රමාණය පර්චස් 32.40

ඉහත කී ඉඩම අංක ත්‍රි/කුනා/ප්‍රා/777 එල් සහ 2000.06.26 දින දරන දීමනාවේ උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් කොටසේ නැවත මැනීමකි.
ඉඩමේ ප්‍රමාණය පර්චස් තිහක් (පර්. 30)

*දේපළට පිවිසීම.* - කන්තලේ නගරයේ සිට සේරුනුවර ප්‍රධාන මාර්ගයේ කි. මී. 01ක් පමණ කන්තලේ පන්සල පසුකර ලීලාරත්න පාර හන්දිය දක්වා ගමන්ගෙන දකුණට හැරී ලීලාරත්න පාරට පිවිස එම පාරේ මීටර් 200ක් පමණ ගමන් ගත් විට අදාළ දේපළ මෙම පාරේ දකුණු පසින් පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2019.06.28 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2019.08.21 වැනි දින මව්බිම, ඩේලිමිරර් හා තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),

4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00,

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකරු (වාණිජ අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
දුරකථන අංක : 011 - 2661835, 011 - 2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449

04-218

---

## ලංකා බැංකුව

## 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක - 74475077, 74475170, 74475261.

කන්තලේ, රජ ඇල, අංක 694/4 හි චම්පිකා රයිස් මිල්ස් හි අයිතිකරුවන් වන රන්තිලක ගෙදර වීරසිංහ මහතා සහ රන්තිලක ගෙදර කරුණාදාස මහතා සහ කෝදාගොඩ ගමගේ පද්මිණි මහත්මිය සහ රන්තිලක ගෙදර නිමල්කා මදුවන්ති රන්තිලක මහත්මිය යන අයගේ හවුල් ව්‍යාපාරය යටතේ ඇති චම්පිකා රයිස් මිල්ස් සමාගමට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 ජූලි මස 07 දිනැති අංක 2027 දරන ගැසට් පත්‍රයේ හා 2017 ජුනි 27 දින "ඩේලිනිව්ස්'', ''දිනමිණ'' හා ''තිනකරන්" යන පුවත්පත් වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදල් ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර ලංකා බැංකුව කන්තලේ පරිශ්‍රයේ දී

**2022 මැයි මස 10 වැනි දින පෙ. ව. 11.00 ට** කොළඹ 08, ෆෙයාර් ෆීල්ඩ් ගාර්ඩන්ස්, අංක 06ඒ හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### පළමුවන උපලේඛනය

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 227/B දරන රජ ඇල ග්‍රාම සේවක නිලධාරි කොට්ඨාසයේ, රජ ඇල ග්‍රාමයේ (කට්ටලෙයි පත්තුව) පිහිටි රජ ඇල කොලනි නමැති ඉඩමෙහි ලොට් 780හි නැගෙනහිර පස බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 780 උතුරට : ලොට් 741 ද, නැගෙනහිරට : ලොට් 780 ද, දකුණට : ලොට් 781 ද, බස්නාහිරට : ලොට් 782 ද මායිම්ව එහි ඇති නිවෙස සහ වී මෝල සහිතව අක්කර එකයි පර්චස් විසිතුනයි දශම බිංදුවයි හයක (අ. 01, රූ. 0, පර්. 23.06) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ත්‍රිකුණාමල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/P/3/54 සහ 55 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු කේ. සෙල්ලපිල්ලෙ විසින් මැනකදී සාදන ලද 1997 සැප්තැම්බර් මස 19 දිනැති අංක 553 දරන මිනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 227/B දරන රජ ඇල ග්‍රාම සේවක නිලධාරි කොට්ඨාසයේ, කන්තලේ රජ ඇල කොට්ඨාස අංක 4හි පිහිටි රජ ඇල, රජ ඇල කොලනි ඒකක 4/694 නමැති ඉඩමෙහි අංක 553 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : එකී අංක 553 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 2 ද, බස්නාහිරට : F.T.P. 2හි ලොට් 782 ද මායිම්ව එහි ඇති නිවෙස සහ වී මෝලකින් සමන්විත වන අතර එකී අංක 553 දරන පිඹුරට අනුව අක්කර එකයි පර්චස් විසි තුනයි දශම බිංදුවයි හයක (අ. 1, රූ. 0, පර්. 23.06) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

### දෙවන උපලේඛනය

ඉහත දෙවන උපලේඛනයේ විස්තර කළ ඉඩමට හා පරිශ්‍රයට සවිකර ඇති සියලු යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණවලට පහත සඳහන් දෑ අයත් වේ.

Description of Machinery (යන්ත්‍රෝපකරණවල විස්තරය)

1. Two 18 feet Elevators with 2 H.P. motors
2. Paddy cleaner with 3 H.P. motor
3. Two paddy stoners within 2 H.P. motors
4. Two Hullers with 10 H.P. motors
5. Two 12 feet elecvators with 2 H.P. motors
6. Automatic elevator and Huller with 10 H.P. motor
7. Separator with 15 H.P. motors
8. Polisher with motor
9. Two Rice Stoner with 2 H.P. motors
10. 17 feet Elevator with 2 H.P. motor
11. Winnower with 2 H.P. motor
12. Winnower with 2 H.P. motor
13. Paddy drier with 30 H.P. motor
14. Paddy cleaner with 3 H.P. motor
15. Huller with 25 H.P. motor
16. Two 12 feet elevators with 2 H.P. motor
17. Tow winnower fans with 2 H.P. motors
18. Polisher with 25 H.P. motor and starter
19. Rice Stoner with 3 H.P. motor and starter
20. 18 feet Elevator with 2 H.P. motor and starter
21. 12x4x4 feet Rice Bin
22. Grader with motor and starter
23. 110KVA Generator
24. Boiler
25. Blower
26. Suction Fan

සහ සැම ආකාරයකම මෙන්ම දැනට කුමන ආකාරයකට හෝ විස්තර කර ඇති සහ මින් පසුවට මෙම පළමු උපලේඛනයේ විස්තර කර ඇති පරිශ්‍රයට සවි කිරීමට නියමිත වෙනත් සියලු දේ ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. විජයබාස්කර්,
ශාඛා කළමණාකරු.

ලංකා බැංකුව,
කන්තලේ ශාඛාව.

04-191